**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2022**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் – 2022**
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level - 2022**

**සාහිත්‍ය න්‍යාය සහ සාහිත්‍ය විචාරය**
**SINE 201**

කාලය පැය(03) තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three (03) Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට 05ට පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ----- வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

## I කොටස

(01). "විභාව අනුභාව සහ ව්‍යභිචාරභාවයන්ගේ සංයෝගයන්ගේ සංයෝගයෙන් රස උපදී." රසවාදය ඇසුරින් එ කී ප්‍රකාශය පැහැදිලි කරන්න.

(02). "අලංකාරයෝ කාව්‍ය ශරීරයෝ ශෝභමාන කරති." පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

(03). "සිංහල සාහිත්‍යකරුවන් ඖචිත්‍ය සංකල්පය කෙරෙහි එතරම් සැලකිල්ලක් දක්වා ඇති සෙයක් නො පෙනේ." පක්ෂ ව හෝ විපක්ෂ ව සනිදර්ශන විග්‍රහයක යෙදෙන්න.

(04). එක්කෝ

ධ්වනි සංකල්පය විචාර පූර්වක ව විමසන්න.

නැතහොත්

ගුණ-රීතිවාදය පිළිබඳ විග්‍රහයක් කරන්න.

## II කොටස

(05). සාහිත්‍ය නිර්මාණයක ආකෘතිය එ කී නිර්මාණයෙහි අර්ථයට දක්වන දායකත්වය නූතනවාදයන් ඇසුරුකොට විමසන්න.

(06). ස්ත්‍රීවාදය වනාහී "ස්ත්‍රීන් ද මනුෂ්‍යයින් ය යන්න පිළිබඳ විප්ලවවාදී සංකල්පයකි." ස්ත්‍රී පරපීඩනය සාහිත්‍යයේ නිරූපිත ආකාරය පහදමින් ඉහත කී අදහස විමසන්න.

(07). "ස්වාභාවික පරිසරය මිනිස් ආධිපත්‍යයට නතු වී ඇතිමුත්, මිනිසා ද සජීවී පරිසර පද්ධතියේ කොටසකි." පරිසරවාදී සාහිත්‍ය න්‍යාය ඇසුරින් එ කී අදහස විමර්ශනය කරන්න.

(08). එක්කෝ

විසංයෝජනීය කියවීම පිළිබඳ සනිදර්ශන විග්‍රහයක් කරන්න.

නැතහොත්

මායා යථාර්ථවාදය පිළිබඳ නිදසුන් සහිත විමර්ශනයක් කරන්න.

(සැම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි).